දෙවන වාරය

## පතුරු නැටුම හා සබැඳි කවි ගායනා

පතුරු නැටුම හා සම්බන්ධ ඊටම ආවේණික වූ කවි ගායනා ව්‍යවහාරයේ පවතී.ගැමි සමාජයත තුළ දක්නට තිබූ සාමුහිකත්වය අව්‍යාජ භාවය,යහ ගුණාංග ඇදහිළි හා විස්වාස ද එම කවි ගායනා තුල අන්තර්ගතවේ.

පතුරු නැටුමේ කවිගායනා විවිධ නාදමාලා හා විවිධ නාද රටා අනුව ගායනා කළ හැකිය.නිවැරදි නාද මාලාවන් අනුව ගායනා කිරීමෙන් එහි සංස්කෘතික වටිනාකම ආරක්ෂාවේ.

**තාල රූපය - මාත්‍රා 4 මහ තනි තිත.**

1.සූරිය කුළ ඇති හිරු දෙවියන්නේ
පදවිය අණසක ලොව පවතින්නේ
කාරිය කරවා පහදා දෙන්නේ
පතුරු නැටීමට අවසර දෙන්නේ

2.ලොව සෙත් කරවන පත්නි සදින්නේ
සළුවක් අරගෙන සළු සලමින්නේ
වෙනසක් නොසිතා මගෙ ගුරුවරුනේ
පතුරක් අරගෙන රඟනෙමු තොසින්නේ

3. අතුරු නැතිව සබයේ සිටින්නේ
මිතුරු ලෙසින් අපි පේළි සැදෙන්නේ
සතුරු වෙලා නොව දෙපිල බෙදෙන්නේ
පතුරු නටන්නට අවසර දෙන්නේ

| / <br> 1 2 3 4 | / <br> 1 2 3 4 | / <br> 1 2 3 4 | / <br> 1 2 3 4 |
|---|---|---|---|
| + සූ රි ය <br> + පද වි ය <br> + කා රි ය <br> + ප තු රු | කු ළ ඇ ති <br> අ ණ ස ක <br> ක ර වා - <br> නැ ටී ම ට | හි රු දෙ වි <br> ලො ව ප ව <br> ප හ දා - <br> අ ව ස ර | ය න් නේ - <br> ති න් නේ - <br> දෙ න් නේ - <br> දෙ න් නේ - |

පැවරුම :-

1. අන්තර් ජාලය ( යූ ටියුබ් ) භාවිතා කරමින් පතුරු නැටුම හා සබැඳි ගායනා ශ්‍රවණය කරන්න.
2. ඉහත දක්වා ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගනිමින් ගායනය සඳහා පෙළබෙන්න.
3. පාසල ආරම්භ වූ පසු තම විෂයභාර ගුරුවරයා සමඟ කවි ගායනා කර වැඩිදුර අධ්‍යනයක යෙදෙන්න.